# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2023/47 - 2017 ජුනි මස 15 වැනි බ්‍රහස්පතින්දා - 2017.06.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

15 (1) වැනි වගන්තිය යටතේ නියමය

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 15 (1) වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව වෙත පැවරී ඇති ඉඩමක් වශයෙන් මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් වඩා පූර්ණ ලෙස විස්තර කර ඇති ඉඩම අද දින සිට ක්‍රියාත්මක වන පරිදි නාගරික සංවර්ධන අධිකාරිය වෙත මෙම නියෝගය මගින් සතු කරමි.

පාඨලී චම්පික රණවක (පා.ම.),
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2017 ජුනි මස 12 වැනි දින,
17 හා 18 වන මහල්,
''සුහුරු පාය''
බත්තරමුල්ල,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ දෙහිවල ගමේ පිහිටි, නගර සභා මිනින්දෝරු විසින් මැන පිළියෙළ කරන ලද සැළසුම් අංක 55 හා 1975 දෙසැම්බර් මස 11 දින දරන මානක සැලැස්මේ කැබලි අංක 1, 2, 3, 4, සහ 5 වශයෙන් පෙන්නුම් කෙරෙන උතුරින් දුම්රියපළ පාර ද, නැගෙනහිරින් ස්ටේෂන් පාර වරිපනම් අංක 21 දරන බිම් කොටස ද, දකුණින් ගාලු පාර, වරිපනම් අංක 22/4 දරන බිම් කොටසින් හා බටහිරින්, ස්ටේෂන් පාර, වරිපනම් අංක 27 සහ 27/1 දරන බිම් කොටස් වලට මායිම් වූ ප්‍රමාණයෙන් අක්. 0, රූඩ්. 1, පර්. 10.90 (අක්කර බිංදුවයි රූඩ් එකයි පර්චස් දහයයි දශම නවයයි බින්දුව) ක් වූ ඉඩම.

06 - 1104


1A - G 25726 — 08 (2017/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*